NTA Bulk Approvel

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையகக் கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayewardenepura Kotte, Sri Lanka. Website : www.defence.lk

තැ.පෙ. / தபால் பெட்டி / P.O. Box 572
දුරකථන / தொலைபேசி / Telephone 011 2430860-9, 011 2430870-8
ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./ Tel.: 011 2381154, ෆැක්ස්/தொ./Fax: 011 2541529, වි. තැපෑල/மி. அ./Email: secdefence@defence.lk

මගේ අංකය / எனது இல. / My No.: MOD/DEF/GS/SALW/4/SLA (I)-(a) (71)

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2023.12.12

ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : MOD/01/2023

යුද්ධ හමුදාපති
නාවික හමුදාපති
ගුවන් හමුදාපති

<u>අමප අංක 18/0111/703/007 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ලබන අයවළුන් වෙත ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීම.</u>

අමප අංක 21/0561/303/047 හා 2021.04.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ ඡේද අංක 05හි අනු අංක (i) හි (ඇ) වගන්තියේ විධි විධාන සංශෝධනය කිරීමේ අරමුණින්, උක්ත මැයෙන් ගරු ආරක්ෂක අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමප අංක 23/1639/603/034 හා 2023.08.28 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අමප අංක 23/1639/603/034 හා 2023.09.11 දිනැතිව අනුමැතිය ලබා දී ඇත.

02. ඒ අනුව, අමප අංක 18/0111/703/007 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ විධි විධාන පරිදි සහන ලැබීමට හිමිකම් ලබන අයවළුන් සියළුම දෙනා හඳුනාගෙන ඔවුන් වෙත එම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සහන හිමිගැන්වීම සඳහා මෙම අමාත්‍යාංශ අනුමැතිය 2025.12.31 දිනට පෙර ලබාගෙන අවසන් කිරීම සඳහා ත්‍රිවිධ හමුදාපතිවරුන් විසින් කටයුතු කළ යුතුය.

03. අමප අංක 23/1639/603/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇති දිනය වන 2023.09.11 දිනට පෙර මෙම අමාත්‍යාංශය මගින් 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සහන හිමිගැන්වීමට අනුමැතිය ලබාදුන් අයවළුන්ට මෙම අමාත්‍යාංශයේ අංක MOD/ 01/2021 හා 2021.05.18 දිනැති චක්‍රලේඛයෙහි අංක 03 ඡේදය යටතේ විධි විධාන සලසා ඇති නිලධාරී කමිටුවක් වෙත නැවත ඉදිරිපත් කිරීමකින් තොරව ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

04. අමප අංක23/1639/603/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇති දිනය වන 2023.09.11 දිනට පසු මෙම අමාත්‍යාංශය වෙතින් 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සහන හිමිගැන්වීමට අනුමැතිය ඉල්ලුම් කරන අයවළුන් සඳහා මෙම අමාත්‍යාංශයේ අංක MOD/01/2021 හා 2021.05.18 දිනැති චක්‍රලේඛයෙහි අංක 03 ඡේදය යටතේවන විධි විධාන එලෙසින්ම අදාළ වන අතර, අදාළ නිලධාරී කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසු ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීමට කටයුතු කළ යුතුය.

05. මෙම අමාත්‍යාංශයේ අංක MOD/01/2021 හා 2021.05.18 දිනැති චක්‍රලේඛයේ අනෙකුත් විධි විධාන වෙනස්වීමකින් තොරව තවදුරටත් අදාළ කරගතයුතු වේ.

06. මෙම චක්‍රලේඛය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත්:-

| | | |
|---|---|---|
| I. | ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය | - කරු. දැ.ගැ.ස |
| II. | අමාත්‍ය මණ්ඩල ලේකම් - අමාත්‍ය මණ්ඩල කාර්යාලය | - කරු. දැ.ගැ.ස |
| III. | ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| IV. | ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| V. | විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය | - කරු. දැ.ගැ.ස |
| VI. | අධ්‍යක්ෂ ජනරාල් - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |

By DG (B&F)
Action:-
..............................
Information:-
..............................
Sig : ..........
Date : ..........

By C of N
Action: DGP
DG B and F
A/COO: 11
Information: DAHS
Sig:
Date: 14.12.2023

(1) Edited by Navy Channel and publish in the Navy Web

(2) Necessary processing and filtering arrangements to be ... Web board.

(3) DNEP NMP